# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2019.08.29

වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 29 වන බ්‍රහස්පතින්දා දින පෙ.ව. 10.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ අඩාලව කල් තැබූ අගෝස්තු මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
03. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
04. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
06. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
09. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
10. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
11. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
12. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
13. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
14. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
15. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
16. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
17. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
18. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
19. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
20. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
21. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි.**

01. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභා ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

(ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා, ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අගෝස්තු මස 20 වන දා අඩාලව කල් තැබූ මහා සභාව තමයි අද පැවැත්වෙන්නේ. අපි සභාවේ වැඩ කටයුතු ආරම්භ කරමු. අපි සභාව නතර කරේ ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමාගේ යෝජනාවලින්. එතුමාගේ යෝජනා වලින් ආරම්භ කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම මේ සභාවට ලියුමක් ඉදිරිපත් කරලා තියෙනවා බොහොම පැහැදිලිව මේ සභාව නීත්‍යානුකූල නෑ කියලා. මේ සභාව ගරු සභාපතිතුමනි, ඔබතුමාට එදා දවස සිහිපත් කරනවා නම් ඔබතුමාට හොඳට මතක ඇති අඩාලව කල් තිබ්බේ නැහැ කියන එක බොහොම පැහැදිලිව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මට අඩාලව කියන එකේ තේරුම කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අඩාලව කියන එකේ තේරුම ඔබතුමාට තෝරලා දෙනවා නම්, සභාවක් ගෙනියන කොට සභාවක් කැඳවනවා කියන එක එකක්. විශේෂ සභාවක් කියන එක එකක්. විශේෂ සභාවක් කියන්නේ, අඩාලව කියන එක තෝරන්න ඒ ටිකත් තෝරන්න ඕන. විශේෂ සභාවක් මන්ත්‍රීවරුන්ට ඉල්ලීමේ හැකියාව තියෙනවා සනපූර්ණය සම්පූර්ණ කරලා ඉල්ලීමෙන්. සභාපතිවරයාට ඒ බලතල තියෙනවා දින තුනක් ඇතුළත කැඳවන්න. අපි සනපූර්ණයෙන් ඉල්ලුවොත් දින 07 ක් ඇතුළත කැඳවීමේ වගකීම සභාපතිට තියෙනවා. ඊළඟට එදින සභාව, 20 වෙනිදා සභාව ඔබතුමා ඉතා පැහැදිලිව විනාඩි 15 කට කල් තියලා පටන් අරගෙන ඊට පස්සේ ඔබතුමා කිවුවා බොහොම පැහැදිලිව ලබන මාසේ 17 වෙනිදා තියෙනවා කියලා. ඔය රෙකෝඩර් එක බලන්න. අපි සාමාන්‍යයෙන් සභාව තියන්නේ මාසේ තුන්වෙනි සතියේ අඟහරුවාදා. ඒ අනුව ඔබතුමා ඒක තිබ්බා. එතකොට කල් තිබ්බට පස්සේ කොයි වෙලාවකවත් ''අඩාලව'' කිව්වේ නෑ. මේකට මේ වචන යොදලා තියෙන්නේ වෙන දෙයක් නිසා නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අඩාලව කියන්න ඕන නෑ. සභාවක් මගදී නැවැත්තුවහම ඒක අඩාලයි. මම දන්නේ නෑ ඔබතුමා දන්නේ නැත්නම්. ඔබතුමා කොයිවෙලෙත් ජ්‍යෝෂ්ඨයි කියා ගන්නවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කියා ගන්නේ නෑ. මම ජ්‍යෝෂ්ඨයි කියලා කියා ගන්නේ නෑ. ඔබතුමාලම තමයි ජ්‍යෝෂ්ඨයි කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම නම් දන්නේ නෑ ඒ කතාවක්. ඔබතුමා දන්නේ නෑ සභාවක් මගදී නවත්වන එක අඩාලද කියලා. ඔබතුමා අවුරුදු ගාණක් මේකේ පොල් ගෑවද කියලා මම දන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මන්දබුද්ධිකයි. ඒකයි මේකේ තත්ත්වය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවුද? මන්දබුද්ධික ඔබතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා මන්දබුද්ධිකයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මන්දබුද්ධික. මගදි නවත්වනවට කියන වචනය මොකක්ද?. අඩාලයි කියන්නේ මොකක්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මගදි නවත්වලා කැඳවනවා. ඔබතුමා කැඳෙව්වේ මහා සභාවක්. දැන් ඔබතුමා මට කියන්නේ ලබන මාසයේ 17 වෙනිදාට ඔබතුමා මොකක්ද කැඳෙව්වේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මහා සභාවක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මහා සභාවක් කැඳෙව්වා. මතක තියා ගන්න අඩාලව කල් තියනවා කියලා ඇරෙන්න එහෙම කැඳවන්න බෑ. මේ සභාව නීත්‍යානුකූල නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කොහොමද එහෙම කියන්නේ. මට පනත අනුව බලතල තියෙනවා. 28 වෙනි වගන්තිය කියවලා තියෙනවාද?. ඔබතුමා පනත කියවලා තියෙනවාද කියලා කියන්න ඉස්සෙල්ලා. රීති යටතේ අංක 28 ඔබතුමා කියවන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම පනත කියෙව්වද නැද්ද කියන එක වැඩක් නෑ. මම කියපු එකට උත්තර දෙන්න. අංක 28 වගන්තිය ඔබතුමා කියවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ''යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් කරනු ලබන සාකච්ඡාවක් අඩාලව කල් තැබීමට සභිකයෙකු විසින් කවර හෝ අවස්ථාවක යෝජනා කළ හැකිය. එම යෝජනාව ස්ථිර කරනු ලැබුවහොත් ඒ පිළිබඳව වහාම ඡන්දය විමසිය යුතුය. රැස්වීමක බරපතල

විනය කඩ කිරීමක් ඇති වූ විටකදී, රැස්වීම අඩාලව කල් තැබීම අවශ්‍යයැයි සභාපතිවරයා විසින් අදහස් කරනු ලැබේ නම් අඩාලව කල් තැබීමේ ප්‍රශ්නය සභාවෙන් නොවිමසාම, රැස්වීම ඔහු විසින් නියම කරන කාල සීමාවකට අඩාලව කල් තැබීම හෝ රැස්වීම අත්හිටුවීම ඔහු විසින් කළ හැකිය.''

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අඩාලව කියලා කිවුවේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අඩාලව කියන එක කියන්න ඕන නෑ. කොහොමද කියන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බොහොම පැහැදිලිව තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහෙද තියෙන්නේ අඩාලව කියන්න තියෙයි කියලා. කොතනද තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අඩාලව කියන එක කියන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රැස්වීම මඟදී නැවැත්වූවහම අඩාලව නෙමෙයිද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අඩාලව කල් තියනවා මෙන්න න්‍යාය පත්‍රය අනුව කියලා කියන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියනවා, මම බොහොම පැහැදිලිව පිළිගන්නවා සභාව මම අඩාලව කල් තැබුවේ සැප්තැම්බර් 17 වෙනිදාට. මම ඒක කියනවා. සැප්තැම්බර් 17 වෙනිදාට අඩාලව කල් තැබුවේ. ඒ මට තියෙන බලය අනුව. මට ඒ වගේම බලය තියෙනවා දින 03 ක් ඇතුළත සභාව කැඳවීමට.

අංක 04, (02) " අඩාලව කල් තබන රැස්වීම පැය 24 ක් ඇතුළත පැවැත්වීමට මුල් රැස්වීමේදී තීරණය කළහොත් මිස අඩාලව කල් තබන ලද රැස්වීමක් පිළිබඳව දැන්වීම, එම රැස්වීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් දින තුනකට කලින් සභිකයින්ට භාර දිය යුතුය.''

දින තුනකට කලින් භාර දුන්නේ නැද්ද?. අද සභාව තියෙන එක දින තුනකට කලින් දැනුම් දුන්නේ නැද්ද?. මඟදි නවත්වපු රැස්වීමක් අඩාලද නැද්ද?. මොකක්ද මේ කරන විකාරය. මොකක්ද ඔබතුමා මේ කරන විකාරය. ඔබතුමා මන්ත්‍රීවරයෙක්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මන්දබුද්ධිකද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මන්දබුද්ධික මන්ත්‍රීවරයෙක්නේ. මම වගකීමෙන් කියන්නේ. ප්‍රේමලාල් අබේසේකර කියන්නේ මන්දබුද්ධික මන්ත්‍රීවරයෙක්. ඔබතුමා කිසිම සභාවක් කරගෙන යන්න නොදීපු මන්ත්‍රීවරයෙක්. ප්‍රේමලාල් අබේසේකර කියන්නේ ඉතිහාසය ගත්තහම එක සභාවක් කරන්න දුන්නේ නෑ. මම අභියෝග කරනවා. මම මාධ්‍යවේදීන්ගෙන් ඉල්ලා සිටිනවා මේකේ හිටපු සභාපතිවරු ගෙන්වලා වොයිස්කට් ගන්න. මේ සභාවල් එකක්වත් කරන්න නොදීපු මන්ත්‍රීවරයා ප්‍රේමලාල් අබේසේකර.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දිල්රුක් අබේකෝන් කියන්නේ කියන දෙයක් කරන කෙනෙක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද කට්ටියට සභාව ඕන නැද්ද?. මම අහන්නේ. අද සභාව ඕන නැද්ද?. සභාව එපාද මන්ත්‍රීවරුන්ට. මහජන නියෝජිතයෝ ඔබතුමාලා. අද සභාව එපාද?. මේ මන්ත්‍රීවරු ඇවිල්ලා ඉන්නේ මිනිස්සු වෙනුවෙන් සේවය කරන්න. මාසෙට දවසයි එන්නේ. මේ වගේ කඩා කප්පල් කරන මන්ත්‍රීවරු හින්දා, හැමතැනම ගියොත් කඩාකප්පල් කරන එක කරන්නේ මේ මන්ත්‍රීවරයා. මේ මන්ත්‍රීවරයා ඉන්න සභාවක් කරනවාද නැද්ද කියන තීරණය ඔබතුමාලා ගන්න. තනි මන්ත්‍රීවරයෙක් හින්දා සභාවක් නොකරනවාද, මේ වචනයක් අල්ල ගෙන අඩාලයි කියන එක නොකිවුවයි කියලා, රැස්වීම මඟදී නැවැත්වූවාම අඩාලද? නැද්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මට පැහැදිලි කරන්න ඉඩ දෙන්න. ඔබතුමා හම්බයා වගේ කතා කරානේ. මට කතා කරන්න ඉඩ දෙන්න. මොන්ගල් වුනාට කමක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොන්ගල් ඔබතුමාටනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මොන්ගල් කවුද කියන්න දන්නවා. මේක බෝපෙ පෝද්දල සභාව නැතුව උළුවිටිකේ හරි, හපුගල හරි, ලබුදූව හරි නෙමෙයි මේක. මේක බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව. මේක යන්න ඕන. මතක තියා ගන්න ඔබතුමා, කරනවානම් බොහොම පැහැදිලිවම සභාව අඩාලව කල් තිබ්බා කියලා කියන්න ඕන. නැත්නම් අඩාලව කියලා වචනයක් වැඩක් නෑ නේ. ඊළඟට කියන්න ඕන න්‍යාය පත්‍රයේ එතන ඉඳන් පටන් අරගෙන යනවා කියලා. ඊළඟ දවසේ මෙන්න මෙදාට අඩාලව කල් තියනවා. න්‍යාය පත්‍රයේ එතන ඉඳන් යනවා කියලා කියන්න ඕන. එහෙම කිවුවේ නෑ. මේ නිසා මම බොහොම පැහැදිලිව කියනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** සභාපතිතුමා, අඩාලව කියන වචනය කිවුවේ නෑ කියලා පිළිගත්තනම් ඉවරයිනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක පිළිගත්තද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියනවා අඩාලව කල් තිබ්බා. හරි මම කිවුවේ නෑ. සභාව අඩාලයිනේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීතුමා, ගරු සභාපතිතුමනි, මේ අඩාලව කියන වචනය පිළිබඳව මේ පනතේ අපිට හිතාගන්න පුලුවන් තැනක නිර්වචනයක් ලැබිලා තියෙනවා. අබේසේකර මන්ත්‍රීතුමා කියන අදහස නෙමෙයි අඩාලව කියන්නේ. අඩාලව සභාවක් කල් තැබීමේදී ගත යුතු ක්‍රියාමාර්ග පනතේ පැහැදිලි කරලා තියෙනවා. ඒ ක්‍රියාමාර්ග තුළ සඳහන් වෙනවා,

“එසේ අඩාලව කල් තැබීමට භාජනය වූ රැස්වීමේ න්‍යාය පත්‍රයේ නිම නොවී ඇති කරුණු ඉදිරි රැස්වීමේදී සාකච්ඡා කළ යුතු වේ. ”,

ඒ කියන්නේ අඩාලව කල් තැබූ කරුණු නැවත ඉදිරියට යනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීතුමා මේ අහන්න. බොහොම පැහැදිලිව තියෙනවානේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** නීතිය, පනත කියන්නේ අබේසේකර මන්ත්‍රීතුමා ඔබතුමා හිතන දේ නෙමෙයි.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා මේ අවශ්‍ය වෙලා තියෙන්නේ ඕක නෙමෙයි. මේ අවශ්‍ය වෙලා තියෙන්නේ මහජනතාව වෙනුවෙන් ඇවිල්ලා, මේ සභාව කරගෙන යන්න නොදී කඩාකප්පල් කරලා සභාව විනාශ කරන්න. මෙතුමා මන්ත්‍රීධූරයට ආපු දවසේ ඉඳන් කරේ සභාවල් කරන්න නොදී සභාවල් විනාශ කරපු එක. ඒක බෝපෙ පෝද්දල ජනතාව දන්නවා. මම මේක කරන්න දෙන්නේ නෑ. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සභාවක් විදියට, ඔබතුමාලාගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට විරුද්ධව පිහිටුවා ගත්ත ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සභාවක් විදියට ඒක මින් ඉදිරියට කරන්න ඉඩ තියන්නේ නෑ ඔබතුමාට. ඔබතුමාට මම ඒක කරන්න දෙන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා මතක තියා ගන්න. ඔබතුමාට නීතිවිරෝධීව එක දශමයක්වත් කරන්න දෙන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම නීතිවිරෝධීව කරලත් නෑ. මම නීතිවිරෝධීව කරලා නම් මේ බෝපෙ පෝද්දල ජනතාව මට විරුද්ධව එළියට බහීවි. පාරට බහීවි. මට විරුද්ධව එක චෝදනාවක්වත් නෑ. මම බොහොම සද්භාවයෙන් වැඩ කරපු සභාපතිවරයෙක්. ඔබතුමාට තියෙන චෝදනා මගෙන් අහගන්න එපා. ඔබතුමා මේ සභාවේ විරුද්ධ වෙලා තියෙන්නේ ෆිනෑන්ස් ඉඩම් සම්බන්ධවයි, අනවසර ඉදිකිරීම් සම්බන්ධවයි විතරයි. ඒවාගෙන් මුදල් අරගෙන සභාවල් විනාශ කරා. පහුගිය සභාවල්වලදී ඔබතුමා ෆිනෑන්ස් සමාගම් පස්සේ ගිහින් සල්ලි ඉල්ලලා අද බෝපෙ පෝද්දලට ෆිනෑන්ස්කාරයෙක් එන්නේ නෑ වැඩ කරන්න. නොඑන්නේ ඔබතුමා හින්දා. ෆිනෑන්ස්කාරයොන්ගෙන් සල්ලි හොරකම් කරලා, ළමයි ඉස්කෝල වලට දානවා කියලා සල්ලි හොරකම් කරලා තියෙනවා. මම බොහොම වගකීමෙන් කියනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කවුද මිනිහෝ හොරකම් කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ආණ්ඩුවෙන් දීපු කොන්ත්‍රාත් වලින්, කුලරත්න මන්ත්‍රීතුමාට දීපු කොන්ත්‍රාත් එකක, කොන්ත්‍රාත්කාරයාගේ ගෙදරට ගිහිල්ලා සල්ලි ඉල්ලුවා. හතලිස් දාහක් ගත්තා ඔබතුමා. මම ඔප්පුකරලා පෙන්වනවා. හතලිස්දාහක් ගෙදරට ගිහිල්ලා ගත්තා. ඔබතුමාට එහෙම වැඩ කරලා මේ සභාව විනාශ කරන්න දෙන්නේ නෑ මම. පුළුවන්නම් යමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තමුන්නාන්සේ මේ වගකීම ගන්නවානම්, තමුන්නාන්සේට මේ සභාව නීතිවිරෝධීව ගෙනියන්න දෙන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තමුන්නාන්සේට මේ සභාව ඉවර කරන්න දෙන්නේ නෑ. මිනිස්සු වෙනුවෙන් අපි මිනිස්සුන්ව එළියට බස්සවනවා. හොරකම් කරන, මිනිස්සුන්ගේ දේවල් ගසා කන, ෆිනෑන්ස්කාරයොන්ගෙන් හොරකම් කරලා, ෆිනෑන්ස්කාරයොන්ගෙන් මංකොල්ලකාපු ප්‍රේමලාල් අබේසේකරට විරුද්ධව මම වැඩකරනවා. මේ සභාපතිකම පුළුවන්නම් කරනවා. ප්‍රේමලාල් අබේසේකරට යට වෙන්නේ නෑ. එක්කෝ මේක කරනවා. නැත්නම් දාලා යනවා. බෝපෙ පෝද්දල ජනතාව මට සභාපතිධූරය ලබා දුන්නේ. නැතුව ප්‍රේමලාල් අබේසේකරට නෙමෙයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාව නිත්‍යානුකූල නෑ මම බෙදීමක් ඉල්ලනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. නිත්‍යානුකූලයි. සභාව නීත්‍යානුකූලයි. බෙදීමක් මොකටද?.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** පනතේ මොන වගන්තියෙන්ද ඉල්ලන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම බෙදීමකට යන්න ඕන නෑ. මේක නීත්‍යානුකූලයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ස්ථිර කරා. යෝජනාව ස්ථිර කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නීත්‍යානුකූලයි. නීත්‍යානුකූලයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** යෝජනාව ස්ථිර වෙලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. ස්ථිර වෙලා නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නීත්‍යානුකූල නෑ කියලා යෝජනාව ස්ථිර වෙලා තියෙනවා. ස්ථිර වුනහම ඒකට බෙදීමකට යන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඉතාම ගෞරවයෙන් අනිත් මන්ත්‍රීවරුන්ගෙන්, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. මෙතුමා එක්සත් ජාතික පක්ෂයේ හින්දා ඔබතුමාලා අමාරුවේ වැටිලා ඇති. මෙතුමාට සහයෝගය දෙනවා ඇති. මම අනිත් මන්ත්‍රීවරුන්ගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ප්‍රේමලාල් අබේසේකර කියන්නේ කවුද කියලා හොයලා බලන්න. මේ ඉතිහාසයේ සභාවල් විනාශ කරපු ප්‍රේමලාල් අබේසේකර කියන්නේ කවුද කියලා ඔබතුමාලා හොයලා බලන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් යෝජනාවක් ඇවිල්ලා තියෙනවා ඒක ස්ථිර වෙලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. සභාව නීත්‍යානුකූලයි. මම කියන්නේ නීත්‍යානුකූලයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කරපු යෝජනාව ස්ථිර වෙලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාව නීත්‍යානුකූලයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නෑ සභාව නීත්‍යානුකූල නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෙදීමක් බෑ. සභාව නීත්‍යානුකූලයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමා එදා සභාව අඩාලව කල් තැබුවේ නෑ. හඬපටය අරගෙන බලන්න. සැප්තැම්බර් 17 වෙනිදට කල් තිබ්බේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව් මම ඒක කිවුවා. කල් තියනවා කියලා කිවුවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා වැරදි වැඩක් කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද වැරදි වැඩේ. මේ සෝෂාකාරි තත්ත්වය තුළ මම කිවුවා ලබන මාසේ 17 ඊළඟ සභාව වෙනකම් කල් තියනවා කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාව අඩාලව කල් තියන්න විතරයි ඔබතුමාට පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාලගේ නායකයෝ ඇහුණා කියන හඬින් ඡන්දය විමසලා සම්මත කර ගනිපු පාර්ලිමේන්තුවක් තියෙන රටක් මේ. හඬින් ඡන්දේ විමසුවේ. මොන හඬද කියලත් ඇහුවා අන්තිමට. පිටිපස්ස පැත්තෙන් ගිහිපු හඬටද කියලත් ඇහුවා අන්තිමට. එහෙම ඡන්ද විමසුවේ ඔයගොල්ලන්ගේ ආණ්ඩුව. ඔබතුමාලා එවෙලේ සහයෝගය ලබා දුන්නා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මෙතන යෝජනාවක් තියෙනවා. ඒ යෝජනාව ස්ථිර කරලා තියෙනවා. ඩඩ්ලි මන්ත්‍රීතුමා යෝජනාව ස්ථිර කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** න්‍යාය පත්‍රයට යන්න. එතනින් එහා දේවල් නෑ. න්‍යායපත්‍රානුකූලව තියෙන්නේ ප්‍රියන්ත මන්ත්‍රීතුමාගේ යෝජනා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි ගෙනාපු යෝජනාව ස්ථිර වෙලා තියෙනවා. සභාවක සභාපතිවරයාගේ යුතුකම තමයි ඒකට පක්ෂද, විපක්ෂද කියලා ගන්න එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. සභාව නීත්‍යානුකූලයිනේ. සභාපතිවරයාට සභාව කැඳවීමේ බලතල තියෙනවා. බලකරලා මන්ත්‍රීවරුන්ව කතා කරවනවා. "මොකද ඔයගොල්ලෝ කතා කරන්නේ නැද්ද?, මම විතරයිනේ කතා කරන්නේ" කියනවා. මෙන්න මන්ත්‍රීවරයෙක්. "මම විතරද කතා කරන්නේ අහනවා." ඔන්න දැන් නැගිටිනවා.

මම අහන්නේ මෙච්චරයි. මේක නීත්‍යානුකූල නොවෙනවානම්, මේකේ ගන්න තීන්දු නීත්‍යානුකූල නෑ. ඒකට ඔබතුමාට පුළුවන් ඉස්සරහට ඕන දෙයක් කරන්න. හරිද?. ඔබතුමාට ඕන දෙයක් කරන්න පුළුවන්. මේක නීත්‍යානුකූල හින්දා තමයි මම නීත්‍යානුකූලයි කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** යෝජනාවක් ගෙනල්ලා සම්මත වෙලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. මේක නීත්‍යානුකූලයි. න්‍යායපත්‍රානුකූලව යන්න ඕන. ඔබතුමාට අද ගන්න තීන්දු පිළිබඳව ප්‍රශ්නයක් තියෙනවානම් නීත්‍යානුකූල නෑ කියලා ඕන තීන්දුවක් ගන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එදා සභාව කඩාකප්පල් කරේ ඔබතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාලා කඩාකප්පල් කරේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එදා ඒ යෝජනාවට බෙදීමක් ඉල්ලුවා. චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා, එතුමාගේ යෝජනාවට විරුද්ධව අදහස් දැක්වුවා. ඒකට බෙදීමක් ඉල්ලුවා. එහෙමනම් විරුද්ධවීමට බෙදීමක් දෙන්න තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතුමා විරෝධතාවය ඉල්ලා අස්කර ගත්තා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා බොරු කියන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ මන්ත්‍රීතුමා, ඔබතුමාලා හැසුරුන විදිය අනුව මම සභාව දෙපාරක් කල් තිබ්බා. මට ලැජ්ජයි. මට හිතාගන්න බෑ ඔබතුමා ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක්ද කියලා. දෙපාරක් කල් තිබ්බා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අන්තිමට ඔබතුමා සභාව අවුල් කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට මේක කරන්න තිබුණා. ''බරපතල ලෙස විනය විරෝධීව හැසිරෙන සභිකයන් ප්‍රාදේශීය සභා ගර්භයෙන් වහා ඉවත්ව එදින රැස්වීමේ ඉතිරි කොටස අවසන්වන තෙක් ඉන් බැහැරව සිටින ලෙසට රැස්වීමක සභාපතිවරයා විසින් විධාන කළ හැකිය.'',

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එහෙම බෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නැත්තේ මොකද?., එහෙම බැරි මොකද?. එතකොට මේවා නීත්‍යානුකූල නැද්ද?. මේවා නීත්‍යානුකූල නැද්ද?. ඔහොම චණ්ඩිකමින් එන්න එපා මන්ත්‍රීතුමා. මෙන්න බලන්න.

''බරපතල ලෙස විනය විරෝධීව හැසිරෙන සභිකයන් ප්‍රාදේශීය සභා ගර්භයෙන් වහා ඉවත්ව එදින රැස්වීමේ ඉතිරි කොටස අවසන්වන තෙක් ඉන් බැහැරව සිටින ලෙසට රැස්වීමක සභාපතිවරයා විසින් විධාන කළ හැකිය. තවද, ස්වකීය නියමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවරක් ගන්නා ලෙස ඔහු විසින් නියම කළ හැකිය.'',

එතකොට මේක නීත්‍යානුකූල නැද්ද?. දැන් ඔබතුමාලා මේ සභාව නීත්‍යානුකූල නෑ කියලනේ කියන්නේ. එතකොට මම ක්‍රියාමාර්ගයක් ගත්තොත් ඒකත් නීත්‍යානුකූල නැද්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා ක්‍රියාමාර්ග ගන්නේ වැරදි විදියට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද වැරැද්ද? විනය විරෝධී හැසිරීමට ගන්නේ. න්‍යායපත්‍රයට නොගිහිල්ලා හැසිරීම, විනය විරෝධී හැසිරීමක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා එදා කිවුව දේ පිළිබඳව වාර්තාව නොදුන්න නිසා ඒක පටන් ගත්තේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පහුගිය සභාවාරයේ න්‍යාය පත්‍රයට පිටින් වැඩකළේ ඔබතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අර බැකෝ එකට ගෙවපු මුදල් පිළිබඳව, ඒක උඩ තමයි මේක කල් ගියේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ආ එහෙමද?, මම දෙපාරක් කැඳෙව්වා. ඔබතුමාට සභාව තියාගන්න වුවමනාවක් නෑ. බෝපෙ පෝද්දල ජනතාව වෙනුවෙන් මම කියන්නේ. මෙතන විපක්ෂයේ වගකීම මේ. මෙතුමාලට සභාව තියන්න වුවමනාවක් නෑ. මාධ්‍යවේදීන් මේක දැනගන්න ඕන. බෝපෙ පෝද්දල සභාව තියෙන්නේ 11ට 11යි යන්නේ. ආණ්ඩු පක්ෂයට 11යි. විපක්ෂයට 11යි. මෙන්න විපක්ෂයේ වගකීම. මාසෙට දවසයි රැස්වීමක් තියෙන්නේ. රැස්වීම තියාගන්න වුවමනාවක් නෑ. අද ගේන නීත්‍යානුකූල රැස්වීමත් කඩාකප්පල් කරන්න වුවමනාව තියෙන්නේ. එක්සත් ජාතික පක්ෂය හා විශේෂයෙන් ජනතා විමුක්ති පෙරමුණ මෙන්න එකතුවෙලා. ආණ්ඩුවත් එකතුවෙලා. සභාවත් එකතුවෙලා යන්නේ. මෙන්න ගේම් එක. මෙන්න අනුර කුමාර දිසානායකගේ ගේම් එක. එක්සත් ජාතික පක්ෂය කොතනද, ජනතා විමුක්ති පෙරමුණ එතන. එතන ඉන්නේ. අද සභාව ඕන නැද්ද?

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාව ඕන නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල ජනතාවට මම කියනවා විපක්ෂයට වුවමනාව තියෙන්නේ මේක. මම සභාව අඩාලව කල් තියනවා. ඊළඟ දිනය දැනුම් දෙන්නම් මම දින 3ක් ඇතුළත. එතෙක් සභාව අඩාලව කල් තියනවා. එකනේ ඕන.

**(සභාව නැවත දැනුම් දෙනතුරු අඩාලව කල් තබන ලදි.)**

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.